C
891.48209
PAT

# සිංහල නාට්‍යයේ ආකෘතිය හා අන්තර්ගතය අතර අරගලය

(ආරම්භයේ සිට 1960 දශකයේ අවසානය දක්වා)

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ
සිංහල පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සඳහා
ඉදිරිපත් කරනු ලබන නිබන්ධය

PERMANENT REFERENCE
FOR USE IN THE
LIBRARY ONLY

ධම්සේන පතිරාජ

1990

4298720

## හැඳින්වීම

මේ නිබන්ධයෙන් අපේක්ෂා කෙරෙන්නේ ආරම්භයේ සිට 1960 දශකයේ අවසානය අතරතුර කාලයෙහි සිංහල නාට්‍ය කලාවේ අන්තර්ගතය හෙවත් ආධ්‍යාත්මයත් ආකෘතියත් අතර හට ගත් අරගලය හකුළා දැක්වීමකි.

ඕනෑම කලා ආකෘතියක් යනු කලාකරුවාට පරපුරින් ලැබෙන්නකි. කලා නිර්මාණයට පෙර එය පවතී. 'සම්ප්‍රදාය' යන නමින් ද හැඳින්වෙන එය මේ නිබන්ධයෙහි 'කලා විඥානය' යනුවෙන් ද හඳුන්වා ඇත.

එක් පසෙකින් මේ විරාගත ආකෘතිය පවත්නා අතර අනෙක් පසින් නිරතුරු චලනය වන්නා වූ යථාර්ථය පවතී. මෙහි යථාර්ථය යනු සමාජ යථාර්ථය යි. මෙය කලා සම්ප්‍රදාය මෙන් නොව ඊට වඩා ගතික ගුණයක් දරන්නකි.

නිරතුරු චලනය වෙමින් වෙනස්වන්නා වූ යථාර්ථය තමන් ග්‍රහණය කර ගන්නා ලෙස කලාකරුවාට අභියෝග කරයි.

පරපුරින් දෙන ලද කලා ආකෘතිය මගින් මේ භෞතික යථාර්ථය ග්‍රහණය කිරීමට තැත් කිරීමේ දී ඒ යථාර්ථයේ පීඩනයෙන් සාම්ප්‍රදායික ආකෘතිය උඩු යටිකුරු වෙයි; ඇතුළත පිටත හැරෙයි; පුපුරා යයි.

අවසානයේ දී කලා කෘතිය ලෙස එළි දකින්නේ නව යථාර්ථය කලා කරුවා ග්‍රහණය කළ අංශයට අනුකූලව නව ස්වරූපයක් ගත් ආකෘතියකි. වෙනත් වචනවලින් කිවහොත් කලාකෘතිය යනු නව යථාර්ථයේ හා විකරණය වූ ආකෘතියේ සමාඝ්‍යෝජනයකි.

මෙහි පළමුවන පරිච්ඡේදය 1956 ට පෙර පැවැති විවිධ ගැමි නාට්‍ය විශේෂ, නාඩගම් හා නූර්ති යන නාට්‍ය ක්‍රම ඇසුරු කොට ගෙන ඉහත දැක්වුණු ප්‍රවාදයට ප්‍රවිෂ්ට වීමේ අරමුණින් ලියන ලද්දකි. සිංහල ගැමි නාටකය පිළිබඳ ව එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ පර්යේෂණත්, නාඩගම් සහ නූර්ති පිළිබඳ ව ඩී.වී.හපුආරච්චි ගුරින්ගේ පර්යේෂණත් එම ප්‍රවාදය විමර්ශනය කිරීම වෙනුවෙන් බෙහෙවින් උපකාරී විනි.

දෙවන පරිච්ඡේදයෙන් විමර්ශනය කරනුයේ සම්මත නාට්‍ය ආකෘතිය අතික්‍රමණය කිරීමට එදිරිවීර සරච්චන්ද්‍රයන් දැරූ පරිශ්‍රමයත් එයට පසුබිම් වූ සමාජ පරිසරයත් ය.

වර්තමාන සිංහල නාට්‍යයේ සැබෑ ආරම්භය සලකුණු කරන <u>මනමේ</u> නාටකයෙන් පසු ශෛලිගත නාට්‍ය රීතිය මුහුණ දුන් අභියෝගයන් සහ 1960න් ඇරඹෙන දශකය තුළ නාට්‍යකරණයට පිවිසි තරුණ නාට්‍යකරුවන් විවිධ ආකෘතීන් හා නව අන්තර්ගතයන් සෙවීම සහ ඉන් බිහිවූ ප්‍රවණතා විමර්ශනය කිරීමක් තෙවන පරිච්ඡේදයෙන් කරනු ලැබෙයි.

ධර්මසේන පතිරාජ